සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය .............................   නාට්‍ය හා රංග කලාව I   කාලය පැය තුනයි

උපදෙස්

- I කොටස II කොටසෙහි සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**I කොටස**

- **පහත දැක්වෙන්නේ ප්‍රාසාංගික කලාවට සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.**

  A - ගායනය, රංගනය, චලනය පදනම් කර ගනී.
  B - බුද්ධියට ආමන්ත්‍රණය කරයි.
  C - ප්‍රේක්ෂක ප්‍රතිචාර අත්‍යාවශ්‍ය නොවේ.
  D - ශිල්පියාගේ පෞර්ෂය මැනවින් හසුරුවයි.
  E - සජීවීව ඉදිරිපත් කරනු ලබයි.

1) ඉහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ප්‍රසාංගික කලාවට අදාළ නිවැරදි ප්‍රකාශ තුන ඇතුළත් වරණය වන්නේ,
(I ). A , D හා E ය  (II). A , C හා E ය  (III) A , B හා E ය  (IV) C , D හා E ය (V) B , C හා D ය  (……)

2) නෘත්ත යනු,
(I) අදහස් ප්‍රකාශනයක් ඇත.  (II) හුදෙක් රිද්මයානුකූල චලනයක් පමණි.
(III) නර්තන නමින් හැඳින්වේ.  (IV) සාත්වික අභිනය ප්‍රබල වේ.
(V) ආංගිකාභිනය මගින් අදහස් ප්‍රකාශනයක් කරයි.  (……)

3) බැලේ නාටක හා සම්බන්ධ වන්නේ,
(I) රංගභූමි අලංකරණ වලට ප්‍රමුඛත්වයක් ලබා දෙන නාට්‍ය විශේෂයකි.
(II) ගායනයට ප්‍රමුඛත්වය ලබා දෙන නාට්‍ය විශේෂයකි.
(III) 16 වන සියවසේ ලොව පුරා පැතිරුණු සම්භාව්‍ය නාට්‍ය විශේෂයකි.
(IV) ඉඟි නළුව යනුවෙන් හැඳින්වෙන රංග විශේෂයකි.
(V) ගායනය, වාදනය, ප්‍රමුඛ සංගීතයෙන් මෙහෙයවන නාට්‍ය විශේෂයකි.  (……)

4) "නාට්‍යය යනු ජීවිතයේ පිටපතකි. සිරිත් විරිත් වල කැඩපතකි" මෙම ප්‍රකාශය කරන ලද්දේ...
(I) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්  (II) ධනංජය පඬිවරයා  (III) අභිනව ගුප්ත
(IV) ඇලඩයිස් නිකොල්  (V) ශේක්ෂ්පියර්  (……)

5) රූපණය හා සම්බන්ධ වන්නේ,

(I) නාට්‍යෝචිත අවස්ථා වේදිකාවක් මත නිර්මාණය කිරීමේ ක්‍රියාවලියකි.

(II) නළුවා නාට්‍ය තුළදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙලයි.

(III) වේදිකාවක් මත භූමිකාවක් ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවලියයි.

(IV) ප්‍රේක්ෂකයාගේ රස වින්දන ක්‍රියාවලියයි.

(V) අධ්‍යක්ෂවරයාගේ නීතිරීති මත සකස් වූ ක්‍රියාවලියයි. (......)

❖ පහත දැක්වෙන මාතෘකා සැලකිල්ලෙන් කියවා අංක **6 – 10** තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| A | - | ස්වරභංග | F | - | පුස්ත | K | - | අශ්‍රු |
| B | - | අංගරචනය | G | - | ස්ථානක | L | - | ආත්මගත |
| C | - | හැඩය | H | - | වර්ණය | M | - | සරල බව |
| D | - | චාරි | I | - | රෝමාංච | N | - | හස්ත |
| E | - | ජනාන්තික | J | - | ආකාශ | O | - | අලංකරණ |

6) ආංගිකාභිනය හා සම්බන්ධ වේ.

(I) A ,D හා Gය (II) D ,F හා Iය (III) D , E හා Iය (IV) C, F හා Kය (V) D, G හා Nය (......)

7) සාත්විකාභිනය හා සම්බන්ධ වේ.

(I) D, F,හාGය (II). A, Iහා Kය (III). A, Dහා Iය (IV) . D, Gහා Mය (V). D, Fහා Gය (......)

8) වාචිකාභිනය හා සම්බන්ධ වේ.

(I) . G, I හා Jය (II). I, J,හා Lය (III). K, Lහා Nය (IV). E, Jහා Lය (V). L, Nහා Oය (......)

9) ආහාර්ය අභිනය හා සම්බන්ධ වේ.

(I) . B, Fහා Oය (II). B, Dහා Iය (III). F, Gහා Nය (IV). I, Jහා Oය (V.) H, Lහා Oය (......)

10) නාට්‍යෝපකරණ හා සම්බන්ධ වේ.

(I ). B, Gහා Jය (II). C, H හා Mය (III). D, Eහා Mය (IV). H, Lහා Oය (V). K, Nහා Oය (......)

❖ අංක **11 – 12** දක්වා නොගැළපෙන පිළිතුර තෝරන්න.

11) නාට්‍යයක් ඉදිරිපත් කරනු ලබන ශෛලියට යෝග්‍ය විය යුතු අංග වන්නේ,

(I) . අංගරචනය ( II). නාට්‍ය සංගීතය (III). වේෂ භූෂණ

(IV). රංග භූමි අලංකරණය (V .) රංගාලෝකය (......)

12) රොමැන්ටික් නාට්‍ය රීතියට අයත් නාට්‍යකරුවන් වන්නේ,

(I ). ඇලෙක්සැන්ඩර් ඩූමා (II). ගර්තේ (III). හෙන්රි බෙක් (IV). ෂිලර් (V) . යෙව්ගින් ෂ්වාර්ට්ස් (......)

❖ පහත දැක්වෙන මාතෘකා අධ්‍යයනය කොට අංක **13** සිට **17** තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A - කෝමොස් | F - ක්‍රිස්ටෝපර් මාලෝ | K - ඔන්කොස් | P - කියතො මොතො |
| B - වෙළඳ ශ්‍රේණි | G - කුමදොරි | L - දෙවෙනි එඩ්රාගේ දර්ශනය | Q - එමිලියා |
| C - නාන්දිය | H - යත්න | M - නෙම්බත්සු ඔදොරි | R - බිංදු |
| D - සෙරිදෙසි | I - ප්‍රාතිහාර්ය නාට්‍ය | N - ටෙම්පස්ට් | S - ජීවිත ගර්වය |
| E - ඓතිහාසික නාට්‍ය | J- ඩිතිරැම්බ් | O - චූලිකා | T - ඩියුඑක්ස්මැෂිනා |

13) මධ්‍යකාලීන ජන වන්දනා නාට්‍ය හා සම්බන්ධ වේ.

(I) . A,B, JහාFය (II) . D,E,I හා Lය (III). K,L,MහාSය (IV). B,I,Lහා Sය (V ). O,P,Qහා Rය (......)

14) කබුකි නාට්‍ය හා සම්බන්ධ වේ.

(I) . A,C,Dහා Hය (II). D,G,Mහා Pය (III). D,E,Fහා Gය (IV). K,L,O හාTය (V). L,M,Nහා Rය (......)

15) සංස්කෘත නාට්‍ය හා සම්බන්ධ වේ.

( I) . C,H,O හා Rය (II). B,D,E හා G ය (III). F,G,H හා J ය (IV). I,K,L හා M ය (V). N,O,P හා Tය (......)

16) ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ වේ.

(I) . D,E,F හා Jය (II). A,B,H හා I ය (III). A,J,K හා Tය (IV). H,I,J හා Lය (V). P,Q,N හා Sය (......)

17) ශේක්ස්පියර් නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

(I) A,D,E හා Oය (II) D,G,H හා J ය (III) K, L,M හා O ය

(IV) E, F, N හා Q ය (V) N, O, P හා Rය (......)

18) පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් කබුකි නාට්‍යයට අදාල ප්‍රකාශ තුන අඩංගු පිළිතුර වන්නේ,

A. ස්ත්‍රී චරිත රඟපානු ලබන්නේ පිරිමි නළුවන් විසිනි.
B. "හකම" සාය රංග වස්ත්‍රාභරණ වලට අයත් වේ.
C. භාවිත කරනු ලබන සංගීත ක්‍රම හතරකි.
D. "ඔකුනි" නම් නාට්‍යාංගනාව හා සම්බන්ධ වේ.
E. "අත්සුමොරි අත් ඉකුනා" ප්‍රසිද්ධ කබුකි නාට්‍යයකි.

(I) . B,C හා Dය (II). A,D හා Eය (III). A,C හා Bය (IV). B,C හා E ය (V). A,C හා Dය (......)

19) සංස්කෘත නාට්‍යයේ "නේතෘ" පිළිබඳව දැක්වෙන ප්‍රකාශ තුන ඇතුළත් පිළිතුර තෝරන්න.

A. - පූර්ව රංගය ඉදිරිපත් කරන ලදි.
B. - නාට්‍යයේ ප්‍රධාන නළුවා වේ.
C. - සෑම විටම නාට්‍ය අවසාන වන්නේ නේතෘගේ අරමුණු ඉටු වීමෙනි.
D. - නාට්‍යයේ පොතේ ගුරුගේ කාර්යය ඉටු කරන ලදි.
E. - ප්‍රාසාංගික කතා වස්තුව ක්‍රියාත්මක වන්නේ නේතෘගේ ආශ්‍රයෙනි.

(I) . A,Cහා Dය (II) B,C හාEය (III). A,D හා E ය (IV). B,C හා Dය (V). A,B හා Cය (......)

20) පින්තූර රාමු වේදිකාවක තිරස්කරණය ලෙස හඳුන්වන්නේ,

(I) . පසුතලයයි (II). රංග භාණ්ඩයි (III). වේදිකා තිරයයි

(IV). රංගාලෝකයයි (V) . වේදිකා අලංකරණයයි (......)

21) රංගාලෝකයෙහි දීර්ඝ වෙලාවක් දල්වා තිබීමෙන් ප්‍රේක්ෂකයාගේ ඇසට යම් අපහසුවක් ගෙන දෙන පහනකි.

(I) . අල්ට්‍රා වයලට් පහන (III). යොමු පහන (V). ස්ට්‍රෝබ් පහන

(II). සෙවනැලි නිර්මිත පහන (IV) . හැලජන් පහන (......)

22) රංගය රිද්මයානුකූලව අවස්ථාවකට අනුව මනාව පෙළ ගැස්වීම හඳුන්වනුයේ,

(I) . ප්‍රේක්ෂාව ලෙසය (II) . රංග විධාන ලෙසය (III). විරාම රංග ලෙසය

(IV). රංග වින්‍යාසය ලෙසය (V) . කථා වින්‍යාසය ලෙසය (......)

23) අහස් තිරය හෙවත් ගගනිකාව යොදා ගනු ලබන්නේ,

(I) දර්ශන මාරු කිරීමට , විවේක කාලය හැඟවීමට , වේදිකාවේ ගැඹුර මවා පෙන්වීමට.
(II) පසුතල දර්ශන මැවීමට , නළු නිළියන් ආවරණය කිරීමට, විචිත්‍ර ප්‍රේක්ෂාවක් මැවීමට.
(III) පසුතල මාරු කිරීමට, නාට්‍ය අවසන් බව හැඟවීමට, ආලෝක පහන් සඟවා තැබීමට.
(IV) ගායක හා වාදක මණ්ඩලය මුවා කර ලීමට, දර්ශන වෙන් කිරීමට, පැති මාරු කිරීමට.
(V) වේදිකාවේ ගැඹුර මවා පෙන්වීමට, පසුතල දර්ශන මැවීමට, රංග භාණ්ඩ සඟවා තැබීමට (......)

24) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නෝ නාට්‍යයේ ප්‍රධාන චරිතය "ෂිතෙ" හා සම්බන්ධ වන්නේ,

A. හෂිගකරි මාවතේ මුලින්ම පැමිණේ.
B. සම්පූර්ණ කතා පුවතම ඔහු වටා ගෙතී ඇත.
C. කුසලතාවය, ප්‍රබලත්වය මත නාට්‍යයේ සාර්ථකත්වය රඳා පවතී.
D. කටහඬ හා අභිනය භාවිතය ලෝක ධර්මී සම්ප්‍රදායට සිදු කරයි.
E. වෙස් මුහුණු පළඳී.

(I) . A,C හා D ය (II). C,D හා E ය (III). B,C හා ,E ය (IV.) B,D හා E ය (V.) A,B හා C ය (......)

25) පහත සඳහන් ප්‍රකාශ අතරින් කබුකි නාට්‍ය වේෂ නිරූපණය / වේෂ භූෂණය හා සම්බන්ධ වන්නේ,

A. වෙස් මුහුණු වර්ග 120ක් පමණ භාවිතා කරයි.
B. දුෂ්ට බව හා අධම බව පෙන්වීමට කළු හෝ නිල් භාවිතා කරයි.
C. හකම නම් සාය භාවිතා කරනු ලබයි.
D. අංග රචනා කිරීමේ විවිධ විලාස 115ක් පමණ වේ.
E. මෙමගින් චරිතයේ අභ්‍යන්තරික ලක්ෂණ බොහෝ සෙයින් අනාවරණය කරයි.

(I) . B,D හා Eය (II). A,B හා Cය (III). B,C හා Eය (IV) . A,B හා D ය (V). C,D හා E ය (......)

- පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 26 – 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - හෙන්රික් ඉබ්සන් | F - හෙන්රික් බෙක් | K - ස්ටැනිස් ලාව්ස්කි |
| B - හැරල්ඩ් පින්ටර් | G - ඇන්ටන් චෙකොෆ් | L - ගුන්තර් ග්‍රාස් |
| C - සර් පිලිප් සිඩ්නි | H - රොබට් ග්‍රීන් | M - එඩ්මන් ස්පෙන්සර් |
| D - එමිල් සෝලා | I - එඩ්වඩ් ඔල්බි | N - අන්ද්‍රෝ අන්තෝනි |
| E - ටෙනිසි විලියම් | J - ආතර් මිලර් | O - එඩ්වඩ් ඇල්බි |

26) අසම්මත නාට්‍ය සම්ප්‍රදාය පදනම් කර ගෙන නාට්‍ය රචනා කරන ලද්දේ,

(I) . A,B, හා Cය (II). C,D හා Eය (III). C,E, හා Hය (IV). G,I හා ,Lය (V). B, I හා L ය (......)

27) යථාදර්ශී රීතියේ පුරෝගාමීන් වන්නේ?

(I) . H,I හා Kය (II). A,G හා Kය (III). B, G හා I ය (IV). B,C හා Dය (V). H,I හා Lය (......)

28) නාට්‍ය නිර්මාණය සඳහා ස්වභාවිකවාදී රංග රීතිය අනුගමනය කරන ලද්දේ,

(I) . E,F හා Jය (II). D,F හා Nය (III). A,B හා D ය (IV) . D,F හා Iය (V). G, H හා Iය (......)

29) මධ්‍යකාලීන ඉංග්‍රීසි සාහිත්‍යයේ ස්වර්ණමය යුගයක් සඳහා නාට්‍ය නිර්මාණ ඉදිරිපත් කරන ලද පුරෝගාමීන් වන්නේ,

(I) . C,H හා Mය (II). A,B හා Cය (III). C,H හා Lය (IV). E,J හා Oය (V). I, M හා N ය (......)

30) ඇමරිකානු නාට්‍ය ඉතිහාසයේ විශිෂ්ට නිර්මාණකරුවන් ලෙස නම් කරන ලද්දේ,

(I) . B,D හා Hය (II). G,H හා Jය (III). E,J හා Oය (IV). J,L හා Nය (V). L,N හා Oය (......)

❖ නිවැරදි පිළිතුර තෝරන්න.

31) මෙහි ඔතෙලෝ නාට්‍යයේ තේමාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(I) ආදරය පළිගැනීම මත පදනම් වූවකි.
(II) එකිනෙක මත ආදරයෙන් යැපෙන දෙදෙනෙක්ගේ ආදරයයි.
(III) ප්‍රේමය, අවිශ්වාසය හා කලකිරීම අතර දෝලනයකි.
(IV) මිනිසාගේ සිත ක්‍රියා කරන්නේ හැඟීම් මත පමණයි
(V) සැබෑ ආදරය හමුවේ පැමිණෙන කුමන්ත්‍රණ ජය ගත හැකිය. (......)

32) "වැඩවසම් රදළ සමාජයේ බිඳ වැටීම" තේමා කර ගත් නාට්‍ය වන්නේ,

(I) . චෙරි වත්ත (II). වලහා (III). ත්‍රී සිස්ටර්ස් (IV) . විලා ෆෝ සේල්(V). ද ප්‍රොපෝසල් (......)

33) පුරුෂාධිපත්‍යයට එරෙහිව නැගී සිටින ස්වීයත්වයෙන් යුතු ස්ත්‍රීත්වය පිළිඹිබු කරන්නේ,

I . වැනීසියේ වෙළෙන්දාහි පෝර්ෂියාය II . චෙරි වත්තේ රනවෙස්කයාය III. ඇන්ටිගනී හි ඇන්ටිගනී

IV . රුකඩ ගෙදරහි නුවුරා ය V . ඔතෙලෝ හි ඩෙස්ඩිමෝනාය (......)

❖ පහත දැක්වෙන වගුව අධ්‍යනය කර අංක **34 – 38** දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| මුල් නාට්‍යය | රචකයා | සිංහල පරිවර්තනය | අනුවර්තනය |
|---|---|---|---|
| A | එව්ගිනි ෂ්වාන්ස් | මකරාක්ෂයා | ධර්මසිරි බණ්ඩාරනායක |
| රන් ෆො යුවර් වයිෆ් | B | රෝමය ගිනි ගනී | බන්දුල විතානගේ |
| ද ග්ලාස් මෙනාජරි | ටෙනිසි විලියම් | C | හෙන්රි ජයසේන |
| රුඩන්ස් | ප්ලෝටස් | කඹය | D |
| E | ඇලෙක්සැන්ඩර් වැම්ප්ලේව් | පුත්‍ර සමාගම | ජයලත් මනෝරත්න |

34) මෙහි A සඳහා අදාල වන්නේ,

(I) . කොමඩි ඔෆ් එරස් (II) . ලේඩි ෆ්‍රොම් ද සී (III) . ද ත්‍රී පෙනී ඔපෙරා

(IV) . ඇපල් කාර්ට් (V) . ද ඩ්‍රැගන් (......)

35) මෙහි B මෙහි සඳහා අදාළ වන්නේ,

(I) . ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් (II) . ඇන්ටන් චෙකොෆ් (III). රේ කැනී

(IV). බර්නාඩ් ෂෝ (V) . හෙන්රික් ඉබ්සන් (......)

36) මෙහි C සඳහා අදාළ වන්නේ,

(I) . අහස් මාලිගා (II). හරිම බඩු හයක් (III). සයුරෙන් ආ ළඳ

(IV) . ට්‍රෝජන් කාන්තාවෝ (V) . හිත හොඳ අම්මණ්ඩි (......)

37) මෙහි D සඳහා අදාළ වන්නේ,

(I) . බන්දුල විතානගේ (II). බන්දුල ජයවර්ධන (III) . ප්‍රසන්න විතානගේ

(IV) .රංජිත් ධර්මකීර්ති (V) . සුනන්ද මහේන්ද්‍ර (......)

38) මෙහි E සඳහා අදාළ වන්නේ,

(I) . මදර් කරේජ් (II) . ද ෆාදර් (III). ද ඇනුවසරි

(IV). දි එල්ඩර් කින් (V). මිඩ් සමර් නයිට් ඩ්‍රීම් (......)

❖ නිවැරදි පිළිතුර තෝරන්න.

39) ග්‍රීක නාට්‍යයේ ආකුලීකරණය යනු,

(I) ගැටුමේ උච්චතම අවස්ථාවයි. (II) කාරුණ්‍යය හා භය මුල් කර ගෙන හට ගැනීම.

(III) ගැටළුවකට පිළිතුරක් හමු වීම. (IV) නොදන්නා යම් දෙයක් අනාවරණය වීම.

(II) ක්‍රමයෙන් ගලා ගෙන ආ සිද්ධි මාලාව තුළ සංකීර්නත්වයක් ඇති වීම. (......)

40) ප්‍රේක්ෂාව යනු,

(I) මොහොතින් මොහොත මැවෙන දර්ශනයයි. (II) ආනුෂංගික කලාවන්හි එකතුවයි.

(III) වේදිකා සැරසිලි බහුල වීමයි. (IV)සුන්දර දර්ශන මැවීමයි

(II) ප්‍රේක්ෂකයා නාට්‍යයට ලබා දෙන විනිශ්චයයි (......)

# නාට්‍ය හා රංග කලාව

## 13 ශ්‍රේණිය

## I පත්‍රය

---

### II කොටස

- A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

1) I . ප්‍රාසාංගික කලාවන්හි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ මොනවාද? (ලකුණු 4)

   II . නාට්‍ය හා රංග කලාව හැර අනෙකුත් ප්‍රාසාංගික කලාවන් දෙකක් තෝරා ගෙන වෙනස්කම් විස්තර කරන්න. (ලකුණු 5)

   III. "නාට්‍ය කලාව ප්‍රාසාංගික කලාවන් අතරින් සුවිශේෂ වේ". ඔබගේ අදහස විචාරශීලීව පැහැදිළි කරන්න. (ලකුණු 6)

2) I . ග්‍රීක ට්‍රැජඩියක මූලිකාංග මොනවාද? (ලකුණු 4)

   II . ඉන් කවියාගේ කාර්යක් නොව වේදිකා පාලකගේ වගකීමක් ලෙස ඇරිස්ටෝටල් අවධාරණය කරන අංගය පිළිබඳව පැහැදිළි කරන්න. (ලකුණු 5)

   III. එම අංගය කෙරෙහි නූතන නාට්‍යකරුවන් අවධානය යොමු කර ඇති ආකාරය විමසන්න. (ලකුණු 6)

3) I . ලෝක ධර්මී නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳව නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් වන්නේ කෙසේද? (ලකුණු 4)

   II. ලෝක ධර්මී නාට්‍ය සම්ප්‍රදායේ දී සතර අභිනය සුවිශේෂී වන අන්දම පැහැදිළි කරන්න. (ලකුණු 5)

   III. ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය සම්ප්‍රදායන් දෙකෙහි වෙනස්කම් ඔබට නිර්දිෂ්ට නාට්‍ය කෘතීන් දෙකක් ඇසුරින් විමසන්න. (ලකුණු 6)

### B කොටස

4) I . අසම්මතවාදී නාට්‍ය බිහි වීමට බලපෑ සමාජ, ආර්ථික පසුබිම පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ලකුණු 4)

   II . එම නාට්‍ය සම්ප්‍රදායට අයත් නාට්‍යකරුවන් දෙදෙනෙකු නම් කොට ඔවුන්ගේ නිර්මාණ පිළිබඳව විමර්ශනයක් කරන්න. (ලකුණු 5)

   III. ඔබ සිතන ආකාරයට නාට්‍ය නිර්මාණකරුවාගේ මූලික පරමාර්ථය ප්‍රේක්ෂකයා වෙත ගෙන ඒමට මෙම නාට්‍ය සම්ප්‍රදාය කොතෙක් දුරට ඉවහල් වන්නේදැයි විමසන්න. (ලකුණු 6)

5) I . ශේක්ෂ්පියර්ගේ නාට්‍ය පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ලකුණු 4)

   II. ශේක්ෂ්පියර්ගේ ඛේදාන්ත නාට්‍ය වල දක්නට ලැබෙන සුවිශේෂතා මොනවාද? (ලකුණු 5)

   III. "ශේක්ෂ්පියර්ගේ නාට්‍ය තුළ සර්ව කාලීන තේමා අන්තර්ගත වේ." උදාහරණ සහිත විමසන්න. (ලකුණු 6)

6) I . වෙස් මුහුණු භාවිත කරන ලද විදේශීය නාට්‍ය සම්ප්‍රදායන් දෙකක් නම් කරන්න. (ලකුණු 4)

   II. ඔබ සඳහන් කළ සම්ප්‍රදායන් දෙකෙහි මූලාරම්භයට බල පෑ සමාජ පසුබිම විස්තර කරන්න. (ලකුණු 5)

   III. "ඉහත සඳහන් සම්ප්‍රදායන් දෙකෙහි භාවිත කළ රංග භූමිය ඊටම ආවේණික වූවකි". විමසන්න. (ලකුණු 6)